# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2299/47 - 2022 සැප්තැම්බර් මස 28 වැනි බදාදා - 2022.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

[යොමුව]

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27(1), 41(3)(ඊ) හා 41(9) වගන්ති සමග කියවිය යුතු 71(1) වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2022 අංක 01 දරන බලයලත් තැනැත්තා ලියාපදිංචි කිරීම හා බලපත්‍ර ලබාදීම (ගාස්තු)නියෝග ලෙස හඳුන්වනු ලැබිය යුතුය.

2. පනත හා කොමිෂන් සභාව විසින් විධිවිධාන සලසනු ලබන වෙනත් සේවාවන් යටතේ බලයලත් තැනැත්තන් අයැදුම්කරණ ගාස්තු මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතුය.

1A - G 37668 — 08 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. මෙම නියෝගවල අරමුණ සඳහා;

(අ) "පනත" යන්නෙන් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අදහස් වේ.

(ආ) ඉහත අර්ථ නිරූපණය කොට නොමැති හා 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත තුළ අර්ථ නිරූපණය කොට ඇති, මෙම නියෝග තුළ භාවිත වන යම් යෙදුමක් වේනම් එයට අදාළව 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතෙහි පවත්නා අර්ථයම මෙම නියෝග තුළද අදහස් වනු ඇත.

(ඇ) මෙම නියෝගවල සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය.

**උපලේඛනය**

| | |
|---|---|
| බලයලත් තැනැත්තකු සඳහා වන අයැදුම්පත් ගාස්තුව | එක්සත් ජනපද ඩොලර් 2,500 |
| ඉදිරිපත් කරන ලද විස්තර වෙනස් කිරීම සඳහා | එක්සත් ජනපද ඩොලර් 100 |
| වාර්ෂික ගාස්තුව | එක්සත් ජනපද ඩොලර් 2,000 |
| ලේඛනයේ උද්ධෘත පිටපත හා බලපත්‍රයේ සහතික කළ පිටපත් සඳහා වූ ගාස්තු | එක්සත් ජනපද ඩොලර් 100 |

EOG 09 - 0356

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.